සියලු ම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மேல் மாகாணக் கல்வித் திணைக்களம்
Department of Education - Western Province

වර්ෂ අවසාන ඇගයීම
ஆண்டு இறுதி மதிப்பீடு - 2021
Year End Evaluation

| | | | |
|---|---|---|---|
| ශ්‍රේණිය / தரம் / Grade: 7 | විෂයය / பாடம் / Subject: බුද්ධ ධර්මය | පත්‍රය / வினாத்தாள் / Paper: I /II | පැය / மணித்தியாலம் / Hours: 2 |

## I පත්‍රය

❖ සැලකිය යුතුයි ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න.

අංක1 සිට 20 දක්වා දී ඇති ප්‍රශ්නවලට වඩාත් ම සුදුසු නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.

**01.** බුදුරජාණන් වහන්සේසත් සතිය ගත කරමින් අනිමිස ලෝචන පූජාව පැවැත්වීම හෙවත් ඇසිපිය නොහෙලා බෝධීන් වහන්සේ දෙස බලා සිටියේ බුද්ධත්වයට පත්වී කිනම් සතියේද?

**01.**පළමුවන සතියේ ය. **02.**දෙවන සතියේ ය **03.**තෙවන සතියේ ය. **04.**සිව්වන සතියේ ය.

**02.** පස්දෙනෙකුගෙන් යුක්තව ඇරඹුන බුදු සසුනේ රහතන් වහන්සේලා වසරක් වන විට

**01.**දහසක් විය **02.**දසදහසක් විය **03.**විසිදහසක් විය **04.** තිස් දහසක් විය

**03.** බුදුගුණඅලංකාරය නමැති පද්‍ය පන්තිය කාගේ කෘතියක් ද ?

**01.**වීදාගම මෛත්‍රේය හිමියන්ගේ ය. **02.** ඇම්. ඇල්. සිල්වා ගුරු මුහන්දිරම් තුමාගේ ය.

**03.**ටිබෙට් ජාතික එස් මහින්ද හිමියන්ගේ ය. **03.**තොටගමුවේ ශ්‍රී රාහුල හිමියන්ගේ ය.

**04.** පිරුවානා පොත් වහන්සේහිඇතුළත් තුන් සූත්‍රය නිවැරදිව දක්වා ඇති පිළිතුර වන්නේ

**01.**මංගල සූත්‍රය,රතන සූත්‍රය,කරණීය මෙත්ත සූත්‍රය

**02.**රතන සූත්‍රය,කරණීයමෙත්ත සූත්‍රය,ගිරිමානන්ද සූත්‍රය

**03.**කරණීයමෙත්ත සූත්‍රය,රතන සූත්‍රය,සිගාලෝවාද සූත්‍රය

**04.**මහා මංගල සූත්‍රය,කරණීය මෙත්ත සූත්‍රය,අනන්තලක්කන සූත්‍රය

**05.** බුදුරජාණන් වහන්සේ යහපත් ගමන්ඇති නිසා සුන්දර වචන ප්‍රකාශ කළ නිසා

**01.**අරහං නම් වන සේක **02.** සම්මා සම්බුද්ධ නම් වන සේක

**03.** සුගත නම් වන සේක **04.**ලෝකවිදූ නම් වන සේක

**06.** ධනංජය සිටුතුමා තම දියණිය වන විශාකා දියණිය  විවාහ වන දිනයේ දුන් අවවාද ගණන

**01.**පහකි **02.**දහයකි **03.**පහළොවකි **04.**විස්සකි

**07.** සූත්‍ර පිටකයේ ඛුද්දක නිකායට ඇතුළත් ධර්ම ග්‍රන්ථයක් වන්නේ

**01.**ධම්මපදයයි. **02.**ලෝවැඩසඟරාවයි. **03.**සිරිත් මල්දමයි. **05.** කාව්‍යශේඛරයයි.

**08.** පිසුනාවාචා යන්නෙහි තේරුම

**01.**බොරු කීමයි. **02.**නපුරු වචන කීමයි. **03.**කේලම් කීමයි. **04.**හිස් වචන කීමයි.

**09.** කරණීය මෙත්ත සූත්‍රයේ සඳහන් වන දිට්ඨා යනුවෙන් අදහස් වන්නේ

**01.**ළඟ වසන සත්වයන් **02.** දුර වසන සත්වයන්

**03.**ඇසට පෙනෙන සත්වයන් **03.**උපන් සත්වයන්

**10.** බුදුරජාණන් වහන්සේ සිගාලෝවාද සූත්‍රය දේශනා කරන ලද්දේ

**01.** උපාලි ගෘහපතියාට ය. **02.**බරණැස් සිටුතුමාට .ය

**03.**යසකුල පුත්‍රයාට ය. **04.**සිගාලක ගෘහපතියාට ය.

**11.** මිච්ඡා ආජීව යනු

**01.**නිවැරදි දිවිපෙවෙතයි. **02.**වැරදි දිවිපෙවෙතයි.

**03.** මිත්‍යා මතයයි. **03.** වැරදි සහ නිවැරදි දිවිපෙවෙතයි.

**12.** සිගාලෝවාද සූත්‍රයේ දී දකුණු දිසාව උපමා කර ඇත්තේ

**01** දෙමව්පියන්ට ය. **02.**ගුරුවරුන්ට ය.

**03.**පැවිදි පක්ෂයට ය. **04.** මිත්‍රයන්ට ය.

**13.** මාතලේ අලුවිහාරයේදී ත්‍රිපිටකය ග්‍රන්ථාරූඪ කිරීම සිදුවූයේ කීවෙනි සංගායනාවේදීද?

**01.**පළමු සංගායනාවේදීය. **02.** දෙවන සංගායනාවේදීය.

**03.** තෙවන සංගායනාවේදීය. **04.** සිවුවන සංගායනාවේදීය.

**14.** ගිලානෝපස්ථානයේ දී  උපස්ථායකයකු තුළ නොතිබිය යුතු ලක්ෂණයක් වන්නේ

**01.**රෝගියාට අවශ්‍ය බෙහෙත් පිළියෙළ කර දීම **02.**ලාභ ප්‍රයෝජන අපේක්ෂාවෙන් යුතුව කටයුතු කිරීම

**03.**මළ මුත්‍ර ආදිය කෙරෙහි පිළිකුල් නූපදවීම **03.**රෝගියාගේ සිත සැනසෙන කතා පැවස

15. බුදු සසුනේ අග්‍ර දායිකාව හා අග්‍ර දායකයා ලෙස සැලකෙන්නේ

01.විශාකා සිටු දේවිය හා අනේපිඬුසිටු සිටුතුමා ය.

02.කෝසල මල්ලිකා සිටු දේවිය හා අනේපිඬු සිටුතුමා ය.

03.සුජාතා දියණිය හා සුදත්ත සිටුතුමා ය.

04විශාකා දේවිය හා පූර්ණවර්ධන සිටුතුමා ය.

16. ආර්ය අෂ්ටාංගික මාර්ගයේ සීල ශික්ෂාව ට අයත් වන්නේ

01.සම්මා දිට්ඨි, සම්මා සංකප්ප, සම්මා වාචායි.

02.සම්මා වාචා, සම්මා කම්මන්ත, සම්මා ආජීවයයි.

03.සම්මා ආජීව, සම්මා වායාම, සම්මා සතියයි.

04.සම්මා වායාම, සම්මා සති, සම්මා සමාධියයි.

17. "ඇඳුමට වැඩි වියදම් නොකරන්නේ" යන කවිය අයත් ග්‍රන්ථය වන්නේ

01.සිරිත් මල්දමයි. 02. ලෝවැඩ සඟරාවයි.

03. කාව්‍යශේඛරයයි. 03. ලෝකෝපකාරයයි.

18. "සිංහලයා ඉතා විනීතය, ආගන්තුක සත්කාරයේ දක්ෂය, ලැදිය, ස්වදේශිකයන්ට මෙන්ම විදේශිකයන්ට ද කාරුණිකය" යන ප්‍රකාශය කරන ලද්දේ

01.රොබට් නොක්ස් විසින් ය. 02. සෝල්බරි ආණ්ඩුකාරවරයා විසින් ය.

02.මහත්මා ගාන්ධි විසින් ය. 03. මිහිඳු හිමියන් විසින් ය.

19. නියාම ධර්ම යටතේ බීජ නියාම යන්නෙන් අර්ථ දක්වන්නේ

01.කාලගුණික හේතු ය. 02. කර්මානුරූප හේතු ය.

03.සිතුවිලි මුල්කොට ගත් හේතු ය. 04. උද්භිද විද්‍යාත්මක හේතු ය.

20. සුනාපරන්තයෙහි වැඩ විසූ පුණ්ණ නම් ශ්‍රාවක ස්වාමීන් වහන්සේගේ චරිතයෙන් ගත හැකි උතුම් ආදර්ශයක් වන්නේ

01. උත්සාහයයි. 02. කළගුණ සැලකීමයි.

03. ඉවසීමයි. 03.පරාර්ථ චර්යාවයි.

## II කොටස

- ❖ පළමු ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න.
- ❖ පළමු ප්‍රශ්නයට ලකුණු 20ක් ද අනෙකුත් ප්‍රශ්න සඳහා ලකුණු 10 බැගින් ද හිමි වේ.

01\. I. බුදුන් සරණ ගිය පළමු ද්වෛවාචික උපාසකවරු කවුරුන් ද ? (ල.2)

II. පස්වග මහනුන්ට දේශනා කළ පළමු සූත්‍රය නම් කරන්න. (ල.2)

III. සිරිත් විරිත් යන්නෙහි තේරුම ලියන්න. (ල.2)

IV. කරණීය මෙත්ත සූත්‍රයේ සඳහන් පරිදි මෙත් වඩන්නකු තුළ තිබිය යුතු ගුණාංග කීය ද? (ල.2)

V. විශාකා සිටු දියණියගේ මව සහ පියා කවුරුන් ද? (ල.2)

VI. බුදුරජාණන් වහන්සේ "අක්කොච්ඡි මං අවධි මං" යන ධම්මපද ගාථාව දේශනා කළේ කවුරුන් අරභයා ද? (ල.2)

VII. චතුරාර්ය සත්‍යයේ මුල් සත්‍ය දෙක ලියන්න. (ල.2)

VIII. සිගාලෝවාද සූත්‍රයෙහි දැක්වෙන ආකාරයට සිසුන්ගෙන් ගුරුවරයාට ඉටුවිය යුතු යුතුකම් දෙකක් ලියන්න. (ල.2)

IX. බුදුරජාණන් වහන්සේගේ බුදුගුණ දෙකක් නම් කරන්න. (ල.2)

X. තොටගමුවේ ශ්‍රී රාහුල හිමියන් විසින් රචිත පද්‍ය ග්‍රන්ථයක් නම් කරන්න. (ල.2)

(ලකුණු 2×10=20)

02\. I.විරතිය හා සමාදානය යනු කුමක් ද? (ල.2)

II.ආජීව අෂ්ටමක ශීලයට අයත් වචනයෙන් සිදුවන අකුසල් කර්ම තුනක් ලියන්න. (ල.3)

III. පන්සිල් රැකීමෙන් සමාජයට සිදුවන යහපත් දේවල් මොනවාදැයි විස්තර කරන්න. (ල.5)

03\. I.ආදර්ශවත් නායකත්ව ගුණධර්ම ඇතුළත් ඔබ උගත් ජාතක කථාව ලියන්න. (ල.2)

II.එම ජාතක කථාව ඇසුරින් පෙන්නුම් කරන නායකත්ව ගුණාංග තුනක් ලියන්න. (ල.3)

III.පාසලේ ශිෂ්‍ය නායකයෙකු ලෙස ඔබ කටයුතු කරන්නේ නම් එම ජාතක කතාවෙන් ඔබට ගත හැකි ආදර්ශ මොනවාදැයි ලියන්න. (ල.5)

04. I. සහජීවනය යනුවෙන් අදහස් වන්නේ කුමක් ද? (ල.2)

II. ඔබ සහජීවනයෙන් වැඩ කළ අවස්ථා තුනක් ලියන්න. (ල.3)

III."පින් මද පුතුන් සියයක් ලදුවත් නිසරු" යන කවිය සම්පූර්ණ කරන්න. (ල.5)

05. I. බුදුරජාණන් වහන්සේ අසරණයන්ට පිහිට වූ අවස්ථා දෙකක් නම් කරන්න. (ල.2)

II.ඔබ නම් කරන ලද අවස්ථාවක් විස්තර කරන්න. (ල.3)

III. පාසල් සිසුවකු වශයෙන් ඔබ අසරණයන්ට පිහිවූ අවස්ථා පහක් ලියන්න. (ල.5)

06. I. මෙත් වඩන්නෙකු තුළ තිබිය යුතු ගුණාංග ඇතුලත් සූත්‍රය කුමක්ද? (ල.2)

II. එම සූත්‍රයේ සඳහන් මෙත් වඩන්නකු තුළ තිබිය යුතු ගුණාංග තුනක් ලියන්න. (ල.3)

III. මෙත්වැඩීම තුළින් ශිෂ්‍ය ජීවිතයට ගත හැකි ආදර්ශ මොනවා දැයි ලියන්න. (ල.5)

07. I. "අජද්ධුමාරිකයන්" ලෙස බුදු දහමෙහි හඳුන්වා ඇත්තේ කවුරුන් ද? (ල.2)

II. සිගාලෝවාද සූත්‍රයට අනුව ධනය නිවැරදිව පරිහරණය කළයුතු ආකාරය දක්වන්න. (ල.3)

III. භෞතික ලෝකයේ සීමිත සම්පත් නිසි කලමනාකරණයෙන් භාවිතා නොකිරීමෙන් ඇතිවන ගැටළු මොනවා ද? (ල.5)

සියලු ම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மேல் மாகாணக் கல்வித் திணைக்களம்
Department of Education - Western Province

තෙවන වාර ඇගයීම
ஆண்டு இறுதி மதிப்பீடு - 2021
Year End Evaluation

| | | | |
|---|---|---|---|
| ශ්‍රේණිය / தரம் / Grade 7 | විෂයය / பாடம் / Subject බුද්ධ ධර්මය | පත්‍රය / வினாத்தாள் / Paper I /II | පැය / மணித்தியாலம் / Hours 2 |

පිළිතුරු පත්‍රය

Iකොටස

| | | | |
|---|---|---|---|
| 1 - 2 | 6 - 2 | 11 - 1 | 16 - 2 |
| 2 - 3 | 7 - 1 | 12 - 2 | 17 - 1 |
| 3 - 1 | 8 - 3 | 13 - 4 | 18 - 1 |
| 4 - 1 | 9 - 3 | 14 - 2 | 19 - 4 |
| 5 - 3 | 10 - 3 | 15 - 1 | 20 - 3 |

IIකොටස

01.

i.තපස්සු භල්ලුක වෙළෙඳ දෙබෑයන්
ii.දම්සක් පැවතුම් සූත්‍රය
iii. කළ යුතු දේ හා නොකළ යුතු දේ
iv.පහළොවයි (15)
v.ධනංජය සිටුතුමා හා සුමනා දේවිය
vi.චුල්ලතිස්ස තෙරුන් අරබයා
vii.දුක්ඛ ආර්ය සත්‍යය ,දුක්ඛ සමුදය ආර්ය සත්‍යය
viii.ගුරු තුමා දුටු විට හුනස්නෙන් නැගිටීම, ඇප උපස්ථාන කිරීම, හොඳින් සවන් දීම, අවශ්‍ය කටයුතු සිදුකිරීම, හොඳින් ඉගනිම, මින් දෙකක් ලියා ඇත්නම් ලකුණු දෙකයි
ix.අරහං, සම්මාසම්බුද්ධ ,විජ්ජාචරණසම්පන්න, සුගත, ලෝකවිදූ .... යන බුදුගුණ වලින් දෙකක්
x.කාව්‍යසේකරය.

**02.**

**i.**අකුසලයෙන් වෙන්වීම, කුසලයේ නිරතවීම

**ii.**බොරු කීම, කේළාම් කීම ,පරුෂ වචන කීම, හිස් වචන කීම

**iii.**පිළිතුරේ අදාළ බව හා ප්‍රමාණය සලකා ලකුණු ප්‍රදානය කරන්න

**03.**

**i.**අපණ්ණක ජාතක කතාව

**ii.**දුරදක්නා නුවණින් යුක්ත වීම, පූර්ව සූදානම ,ඉවසිලිවන්ත බව, විමසිලිමත් බව, නිවැරදි තීරණ ගැනීම, සංවිධාන ශක්තියෙන් යුක්ත වීම, වගකීමෙන් හා වගවීමෙන් යුතු බව

**iii.**පිළිතුරේ අදාළ බව හා සමස්තය සලකා ලකුණු ප්‍රදානයන කරන්න

**04.**

**i.**ජාති ආගම් කුල වශයෙන් බෙදී කටයුතු නොකර සියලු දෙනා සමඟ සමගි ව ජීවත් වීම

**ii.**පාසැලේ දී ගැහැණු පිරිමි දෙපිරිසම ආගම් වශයෙන් එක්ව කටයුතු කිරීම ,කෑම ගැනීම එකට සිදුකිරීම ගොවිතැන් කටයුතුවලදී ,මංගල අවමංගල කටයුතු වලදී වැනි පිළිතුරු ලියා ඇත්නම් ලකුණු ලබා දෙන්න

**iii.** පින් මද පුතුන් සියයක් ලදුවත් නිසරු
ගුණ නැණ බෙලෙන් යුතු පුතුමය ඉතා ගරු
එක පුන් සඳින් දුරු වෙයි ලොව ගන අඳුරු
නෙක තරු රැසින් එලෙසට නොම වේය දුරු

යන කවිය සම්පූර්ණයෙන් ලියා ඇත්නම් ලකුණු ලබා දෙන්න.

**05.**

**i.**සුනීත ,සෝපාක ,අසරණ මහලු පියෙකු, වරදට හසු වූ නිවැරදි ගොවියා, පටාචාරා

**ii.**මින් එක් අවස්ථාවක් විස්තර කැර ඇත්නම් ලකුණු තුනක් ලබා දෙන්න ලබාදෙන්න

**iii.**අවස්ථා පහක් ලියා ඇත්නම් ලකුණු පහක් දෙන්න

**06.**

**i.**කරණීය මෙත්ත සූත්‍රය

**ii.**දක්ෂයකු වීම, අවංක වීම, කීකරුකම, මෘදු බව, අනතිමානී බව ,ලද දෙයින් සතුටු වීම ,පහසුවෙන් පෝෂණය කළ හැකි බව ,සැහැල්ලු ගති පැවතුම් තුනක් ලියා ඇත්නම් ලකුණු තුනක් දෙන්න

**iii.**පිළිතුර ප්‍රමාණවත් බව සලකා බලා අදාල ලකුණු ලබා දෙන්න

**07.**

**i.**සූත්‍ර පිටකය ඛුද්දක නිකාය

**ii.** අක්කොච්ඡිමං අවධිමං - අජිනිමං අහාසිමේ
යේතං උපනයිහන්ති - වේරං තේසං නසම්මති

**iii**පිළිතුරේ අදාළ බව ප්‍රමාණාත්ම බව සලකා බලා ලකුණු ප්‍රදානය කරන්න